# <u>ටෙන්ඩර් උපදෙස්</u>

1. ටෙන්ඩරය සඳහා ඉල්ලුම් කල යුත්තේ **<u>2025.09.19 දින පෙ.ව.9.00 සිට 2025.10.01 දින ප.ව.3.00 දක්වා</u>** කාලය තුල නිකුත් කරනු ලබන ටෙන්ඩර් ආකෘති පත්‍ර මඟින් පමණක් වේ. ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනුයේ ටෙන්ඩර් පෝරම ගාස්තු ගෙවීම වෙනුවෙන් ලබාගත් ලදුපත එකී පුද්ගලයා විසින් ඉදිරිපත් කිරීමෙන් අනතුරුවය.

2. පිළිගත් ආකෘති පත්‍රය මඟින් ඉදිරිපත් කරනු නොලබන හෝ මෙහි සඳහන් කර දක්වා ඇති කොන්දේසි හා අවශ්‍යතාවයන්ට තරයේ අනුකූල නොවන කිසිදු ටෙන්ඩරයක් සලකා බලනු නොලැබේ.

3. ටෙන්ඩර් ලියවිලි වල යම්කිසි වෙනස් කිරීමක් හෝ මකා දැමීමක් කරනු ලැබුවේ නම්, ඒ සෑම ස්ථානයක් ම ටෙන්ඩර්කරු විසින් කෙටි අත්සන යොදා සහතික කල යුතුය.

4. සෑම ටෙන්ඩර්කරුවෙකු විසින්ම ආපසු ගෙවන ලද ටෙන්ඩර් තැන්පත් මුදල දික්වැල්ල ප්‍රාදේශීය සභාවේ තැන්පත් කර ලබාගත් **<u>ලදුපත ටෙන්ඩර් මුල් පිටපතේ අමුණා තිබීම</u>** අනිවාර්ය වේ. එසේ නොකර පසුව ඉදිරිපත් කරන ලදුපත් සඳහා තැන්පත් මුදල් ගෙවනු නොලැබේ.

5. සියළුම ටෙන්ඩර් පිටපත් දෙකකින් යුතුව වෙන වෙනම කවර දෙකක **<u>මුල් පිටපත</u>** හා **<u>දෙවන පිටපත</u>** ලෙස සඳහන් කර මුද්‍රා තබා **<u>(මුද්‍රා තබන ලද කවර 2හි වම්පස උඩ කෙලවරෙහි ව්‍යාපෘතියෙහි නම ලිවිය යුතුය)</u>** එම මුද්‍රා තබන ලද කවර 2ක එකම කවරයක බහා නැවත මුද්‍රා තබා **<u>(මුද්‍රා තබන ලද කවරයෙහි වම්පස උඩ කෙලවරෙහි ව්‍යාපෘතියෙහි නම ලිවිය යුතුය)</u>** දික්වැල්ල ප්‍රාදේශීය සභාවේ සභාපති වෙත ලැබෙන සේ **<u>ලියාපදිංචි තැපෑලෙන්</u>** යොමු කල යුතුය. නොඑසේ නම් දික්වැල්ල ප්‍රාදේශීය සභාවේ ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතුය. එය 2025.10.02 දින ප.ව. 2.00 ට පෙර ලැබෙන සේ දික්වැල්ල ප්‍රාදේශීය සභාව වෙත එවිය යුතුය.

6. කවර හෝ ටෙන්ඩර්කරුවෙක් කොන්ත්‍රාත්තුව හා ගිවිසුම අත්සන් කිරීමට අපොහොසත් වන්නේ නම් හෝ එසේ කිරීම ප්‍රතික්ෂේප කරන්නේ නම් සහ ටෙන්ඩරය පිළිගත් බව සඳහන් ලිඛිත නිවේදනයක් ලැබීමෙන් දින 10 ක් තුළ අනුමත කරන ලද ඇප මුදල ඉදිරිපත් කිරීමට අපොහොසත් වන්නේ නම්, එකී තැන්පත් මුදල සභාව සතු කරනු ලැබෙනවා ඇත. ටෙන්ඩර්කරු විසින් සඳහන් කර ඇති ලිපිනය වෙත ලියාපදිංචි තැපෑලෙන් යවනු ලැබ ඇත්නම් හෝ එකී ලිපිනය වෙත භාරදී ඇත්නම් හෝ එකී දැන්වීම එම ටෙන්ඩර්කරු වෙත ලැබී ඇති බවට සලකනු ලැබේ.

7. කොන්ත්‍රාත්තුව සඳහා අවශ්‍ය ආරක්ෂිත ඇප මුදල් ප්‍රමාණය කොන්ත්‍රාත්තුවේ වටිනාකමින් 5% හෝ තාක්ෂණික ඇගයීම් කමිටුව නිර්දේශ කරන ලද මුදල දික්වැල්ල ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතුය.

8. ටෙන්ඩර්කරුවෙකු ලෙස තමා තෝරා ගතහොත් තමා විසින් ඇතුළත් විය යුතු ගිවිසුම් පිළිබඳව විස්තර සඳහන් කොන්ත්‍රාත් ගිවිසුම් ආකෘති පත්‍රය ටෙන්ඩර්කරුවන් විසින් ප්‍රාදේශීය සභාව වෙතින් ලබාගෙන ඉතා සුපරීක්ෂාකාරීව අධ්‍යයනය කල යුතු අතර, අවශ්‍ය වේ නම් ප්‍රාදේශීය සභා කාර්යාලය වෙතින් ඒ පිළිබඳ පැහැදිලි කිරීම් ලබා ගත යුතුය.

9. ටෙන්ඩරය අහිමි වූ ටෙන්ඩර්කරුවන්ගේ තැන්පත් මුදල් කොන්ත්‍රාත් ගිවිසුම අත්සන් කරනු ලැබීමෙන් අනතුරුව ආපසු ගෙවනු ලැබේ.

10. නිසි පරිදි දෙන ලද අවසරයකින් තොරව කිසිදු කොන්ත්‍රාත්තුවක් අනෙකෙකු වෙත පැවරීමට හෝ අතුරු බදු දීමට නොහැකිය.

11. ටෙන්ඩරය පිරිනමන දින ටෙන්ඩර්කරු විසින් දික්වැල්ල ප්‍රාදේශීය සභාව සමඟ ගිවිසුමකට එළඹිය යුතුය.

12. **<u>පූර්ව ලංසු කැඳවීමේ රැස්වීම 2025.09.29 වන සඳුදා දින පෙ.ව.10.00</u>** ට දික්වැල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී පැවැත්වේ. එහිදී ටෙන්ඩර් කර ඇති කර්මාන්තවලට අදාළ තොරතුරු සම්බන්ධයෙන් තාක්ෂණ සේවා නිලධාරී මහතාගෙන් විමසීම් කල හැකිය.

13. **<u>2025.10.02 දින දික්වැල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ප.ව.2.00</u>** ට ටෙන්ඩර් විවෘත කරනු ලබන අතර ටෙන්ඩර් මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වේ.

රුවන් වික්‍රමආරච්චි,
සභාපති,
දික්වැල්ල ප්‍රාදේශීය සභාව